# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,697—1959 මාර්තු 7 වැනි සෙනසුරාදා—7.3.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : O. 457/57.

ලංකාවෙහි, පිලිප්පයින් දූපත් සඳහා අති විශේෂ හා පූර්ණ බල ඇමති ලෙස බලය පවරනු ලැබූ, ගරු මැනුඑල් ඒ. ඇල්ෂේට් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මාර්තු 6 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය, කොළඹ.

---

අ.ආ.කා. අංකය : O. 462/58.

ලංකාවෙහි, තුර්කිය සඳහා අති විශේෂ හා පූර්ණ බල තානාපති ලෙස බලය පවරනු ලැබූ, කද්රි රිෂාන් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මාර්තු 6 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය, කොළඹ.

---

### 1950 අංක 25 දරණ ආහාර පාලන ආඥපනත

**අංක 114 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන ආඥපනතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, මෙම නියෝගයෙන් :—

(1) යමෙකු විසින් ගෙනයනු ලබන රාත්තල් 7ක ප්‍රමාණයක් හැර, රතුලූනු හෝ බෙලරි ලූනු කොයියම් ප්‍රමාණයක්වත් යාපනේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැනගේ බලපත්‍රයක් නැතිව—

(අ) යාපනේ අර්ධද්වීපය කලපුවේ, වෙරළේ හෝ මුහුද වට යම් ස්ථානයකින්, ඔරුවකින් හෝ රුවල් යාත්‍රාවකින් ;

(ආ) යාපනේ අර්ධද්වීපයෙන් ;

(ඇ) මහනුවර-යාපනය පාරේ ඇලිපන්ට් පාස් පාලම (167/1) සහ අංක 167/2 දරණ බෝක්කුව අතර පාරේ ;

(ඈ) නවට්කුලි-කරතිව් පාරේ අංක 10/1 දරණ බෝක්කුව සහ කරතිව් පැත්තේ පාරේ කෙළවර දක්වා ;
ප්‍රවාහණය කිරීම හෝ ගෙනයාම තහනම් කරමි.

මේ නියෝගය සඳහා ''යාපනේ අර්ධද්වීපය'' නමින් හැඟවෙන්නේ පූනකරි ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය සහ කරච්චි-තුනුක්කායි ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය හැර යාපනේ ආදායම් දිස්ත්‍රික්කයයි.

2. 1958 සැප්තැම්බර් 19 වෙනි දින අංක 11,527 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ අංක 95 දරණ නියෝගය ද මෙම නියෝගයෙන් අවලංගු කරමි.

සී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959. 4. 3 දින,
කොළඹ කෘෂිකර්ම හා ආහාර ඇමති කාර්යාලයේ දීය.

741—ජේ. ඇන්. ආර් 676—4,700 (3/59)

# මිළ පාලන දැන්වීම්

**අංක ඇම.ටී/2/59 දරණ ආහාර මිළ නියෝගය** **සහල්**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හෙට්ටිගේ දෙන් ටියුඩර් බෝදිදස වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වන වගන්තියෙන් හා 3(2) යන වගන්තියෙන් ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,345 සහ 1958 ජුනි 6 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක ඇම්. ටී. 25 සහ 1958 මැයි 31 වෙනි දින දරණ මිළ නියෝගය 1959 මාර්තු 9 වෙනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) 1959 මාර්තු 9 වෙනි දින සිට මීට යාකර ඇති 1 වෙනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් තොග වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) 1959 මාර්තු 9 වෙනි දින සිට මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් සහල් විකිණීමෙදී ශුද්ධ බර රාත්තලක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද, මේ නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(5) සහල් විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍ර කොට බාල කිරීමෙන් සහල් නොවිකිණිය යුතු බවත්,

(6) සහල් විකිණීමේදී සහල් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බව ද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදෙශයකම සහල් යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සහල් සඳහා නියම කරනු ලැබූ, වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකට පෙනෙන පරිදි තැබිය යුතු බවත්,

(8) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා ''රාත්තල්'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(9) මේ මිල නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් ප්‍රමාණය ;

(ඇ) විකුණූ සහල් ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දියයුතු බවත් මෙයින් නියම කරමි.

1959 මාර්තු මස 2 වැනි දින පස්වරු 3.30ට මාතර කච්චේරියේදී අත්සන් කරන ලදී.

එච්. ඩී. ටී. බෝදිදස,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාළක තැන.

### 1 වෙනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>ශුද්ධ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| මාතර පළාත් ආණ්ඩු සභා සීමාව ... ... | 19 77 |
| මඩිහ ගොඩගම ගම්සභා සීමාව ... ... | 19 84½ |
| දෙවුන්දර දකුණ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 84½ |
| නාදුගල ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 19 84½ |
| ගන්දර බටහිර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 90 |
| ගන්දර නැගෙනහිර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 91 |
| තිහගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 91 |
| නායිම්බල ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 92 |
| කිරින්ද-මගින් ඉහළ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 93 |
| කරගොඩ–උයන්ගොඩ (1) ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 93 |
| කෝට්ටගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 94 |
| කිරින්ද-මගින් පහළ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 94 |
| කරගොඩ–උයන්ගොඩ (2) ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 94 |
| පරදුව ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 19 95 |
| තිබ්බොටුවාව ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 97 |
| දික්වැල්ල දකුණ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 97 |
| අකුරැස්ස ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 19 97 |
| දික්වැල්ල මුස්ලිම් වීදිය ... ... | 19 97 |
| දික්වැල්ල උතුර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 98½ |
| මාරඹ දකුණ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 99 |
| මාරඹ උතුර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 20 01 |
| හක්මන ගම්කාර්‍ය්‍ය සභා සීමාව ... ... | 20 01 |
| කඹුරුපිටිය ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 20 01 |
| කන්දපිට වලකඩ ගම්කාර්‍ය්‍ය සභා සීමාව ... | 20 03 |
| පනාදුගම ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 20 03 |
| මොරවක ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 20 17 |
| කොටපොල ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 20 22 |
| දෙනියාය ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 20 29 |
| වැලිගම නගරසභා සීමාව ... ... | 19 60 |
| දෙනිපිටිය ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 66 |
| වටගෙදරමුල්ල මුස්ලිම් ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 63½ |
| වටගෙදරමුල්ල සිංහල ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 63½ |
| කඩුකන්න ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 77½ |
| උඩුකාව ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 19 76 |
| පොල්වත්ත ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 66 |
| කඹුරුගමුව ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 77½ |
| මිරිස්ස උතුර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 70 |
| මිරිස්ස දකුණ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 70 |

## 2 වැනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|
| | ශත. |
| වැලිගම නගර සභා සීමාව ... ... | 18 |
| මාතර නගර සභා සීමාව ... ... | 18¼ |
| මඩිහ ගොඩගම ගම්කායම් සභා සීමාව ... | 18¼ |
| වැලිගම ගම්කායම් සභා සීමාව ... ... | 18¼ |
| මාලිම්බඩ ගම්කායම් සභා සීමාව ... ... | 18¼ |
| නායිමන–මාකාවිට ගම්කායම් සභා සීමාව ... | 18½ |
| දෙවුන්දර සුළු නගරසභා සීමාව ... ... | 18½ |
| දෙවුන්දර ගම්කායම් සභා සීමාව ... ... | 18½ |
| කැකනදුර ගම්කායම් සභා සීමාව ... ... | 18½ |
| ගොඩපිටිය ගම්කායම් සභා සීමාව ... ... | 18½ |
| තිහගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18½ |
| පහළවිටියල ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18½ |
| කපුදූව ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18½ |
| නායිම්බල ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18½ |
| බන්ඩත්තර ගමුලාදෑනි කොට්ඨාශය ... ... | 18½ |
| නාදුගල ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18½ |
| අත්තුඩාව ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18½ |
| පාලටුව ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18½ |
| අකුරැස්ස ගම්කායම් සභා සීමාව ... ... | 18½ |
| දික්වැල්ල ගම්කායම් සභා සීමාව ... ... | 18¾ |
| කන්දපිට වලකඩ ගම්කායම් සභා සීමාව ... | 18¾ |
| හක්මන ගම්කායම් සභා සීමාව ... ... | 18¾ |
| කරගොඩ–උයන්ගොඩ 1 සහ 2 ගම්මුලාදෑනි කොට්ඨාශය | 18¾ |
| කඹුරුපිටිය ගම්කායම් සභා සීමාව ... ... | 18¾ |
| යටියන ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18¾ |
| මැද උයන්ගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18¾ |
| උඩුව නැගෙනහිර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18¾ |
| ගල්බඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 18¾ |
| උඩුව බටහිර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18¾ |
| කෝමංගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18¾ |
| අන්ගුන්න බදුල්ල ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 18¾ |
| කැටියපේ ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 19 |
| කිතලගම බටහිර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19 |
| මොරවක ගම්කායම් සභා සීමාව ... ... | 19 |
| මාවරල ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... | 19 |
| කොටපොල උතුර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19¼ |
| කොටපොල දකුණ ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19¼ |
| දෙනියාය ගම්කායම් සභා සීමාව ... ... | 19¼ |
| බෙරලපනාතර ගම්කායම් සභා සීමාව ... | 19½ |
| සියඹලාගොඩ බටහිර ගම්මුලාදෑනි කොට්ඨාශය ... | 19¾ |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් විකිණිය නොහැකිය. (2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි තොග වශයෙන් විකුණනු ලබන යම් සහල් ප්‍රමාණයක් ඇතහොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ශුද්ධ බර හොණ්ඩරයකට ගෙවන ඉහත සඳහන් මිළ අනුව ගණන් බලා මිළ තීරණයක් ගත යුතුය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී